# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2349/17 - 2023 සැප්තැම්බර් මස 12 වැනි අඟහරුවාදා - 2023.09.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 104/44(vi) ඒ

**(87 වන අධිකාරය වූ) භාර ආඥාපනත**

114 වන වගන්තිය යටතේ වූ නියමය

"අංජලී සහ ප්‍රියන්ජිත් වීරසූරිය පුණ්‍ය අරමුදලේ" භාරකරුවන්, එනම් -

1. රජින්ද ප්‍රියන්ජිත් වීරසූරිය;
2. තුෂාරි අංජලී තිලෝත්තමා ද සිල්වා වීරසූරිය; සහ
3. බුද්ධිකා තරුෂ ද එස් වීරසූරිය,

විසින්, (87 වන අධිකාරය වූ) භාර ආඥාපනතේ 114 වන වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබීම සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වෙත ඉල්ලුම් කර ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 144 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ආචාර්ය විජයදාස රාජපක්ෂ වන මම, මේ නියමය මගින් එකී භාරකරුවන් සංස්ථාගත කිරීමට මේ නියමයෙන් බලය පවරන අතර -

(අ) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, සෙම්බුකුට්ටි ආරච්චිගේ දෝන අවන්තිකා රුක්ෂානි සේනාරත්න විසින් සහතික කරන ලද 2020 ජූලි මස 30 වැනි දිනැති අංක 495 දරන භාර ඔප්පුව යටතේ යථා පරිදි පත් කරන ලද ඉහත නම් සඳහන් භාරයේ භාරකරුවන් සහ ඔවුන්ගේ තත්කාලීන අනුප්‍රාප්තිකයන් "අංජලී සහ ප්‍රියන්ජිත් වීරසූරිය පුණ්‍ය භාරය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු යයි ද;

(ආ) එකී භාරකරුවන් විසින්, එකී නාමය සහ අභිධානය යටතේ, එකී භාරය වෙනුවෙන්, යම් චංචල හෝ නිශ්චල දේපළ මිල දී ගැනීම, භාරගැනීම, දැරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් අත්කර ගැනීම, විකිණීම, හුවමාරු කිරීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, බදු දීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කළ හැකි යයි ද; සහ

(ඇ) එකී භාරයට අදාළව පැන නගින සියලු නඩුවල දී සහ නඩු කටයුතුවල දී ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් ස්ථානයක ඕනෑම අධිකරණයක දී එකී නාමයෙන් සහ අභිධානයෙන් එකී භාරකරුවන් විසින් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට, උත්තර දීමට සහ උත්තර දෙනු ලැබීමට, විත්තිවාචක ඉදිරිපත් කිරීමට සහ විත්තිවාචක ඉදිරිපත් කරනු ලැබීමට ද නීතිය අනුව හැකියාව සහ බලය ඇත්තේ යයි ද,

විධාන කොට ප්‍රකාශ කරමි.

මේ නියමය ප්‍රත්‍යාදිෂ්ට කිරීම, නැතහොත් අවශ්‍ය යයි මට පෙනී යන ආකාරයට කලින් කල වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම මා විසින් කරනු ලැබිය හැකි ය.

ආචාර්ය **විජයදාස රාජපක්ෂ**,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2023 සැප්තැම්බර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

EOG 09 - 0096

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.